# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1835/37 – 2013 නොවැම්බර් 08 වැනි සිකුරාදා – 2013.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නිමලගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේඡ්/අයිඑන්ජී/12/198 හා 2012.09.05 දිනැති අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 3.0458ක් පමණ වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඉංගිරියවත්ත – ප්‍රමාණය: හෙක්. 1.5604ක් පමණ**

උතුරට: මාර්ගය සහ අයිතිකරු සොයාගත නොහැකි ඉංගිරියවත්ත; නැගෙනහිරට: අයිතිකරු සොයාගත නොහැකි ඉංගිරියවත්ත, ප්‍රාදේශීය සභා මාර්ගය, අනුලා ප්‍රනාන්දු, අබේරත්න සහ රන්ජන් ජයකොඩි හිමිකම් කියන සොයිසා වත්ත; දකුණට: රන්ජන් ජයකොඩි හිමිකම් කියන සොයිසා වත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

02. **කැබලි අක්ෂර 'බී' – ඉංගිරියවත්ත – ප්‍රමාණය: හෙක්. 1.4854ක් පමණ**

උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ ශන්මුගම් රාජේන්ද්‍රන් හිමිකම් කියන ඉංගිරියවත්ත සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ අයිතිකරු සොයාගත නොහැකි ඉංගිරියවත්ත; දකුණට: අයිතිකරු සොයාගත නොහැකි ඉංගිරියවත්ත සහ ඇළ; බටහිරට: ඇළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ ශන්මුගම් රාජේන්ද්‍රන් හිමිකම් කියන ඉංගිරියවත්ත සහ මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/2/2012/එච්ජී/171.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
2013 ඔක්තෝබර් මස 25 වැනි දින,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

11 - 846

1A – G 18512 – 165 (2013/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*